උපේක්ෂා සේනානායක ලියයි

# ප්‍රතිබිම්බ 4

## “මැඩම් මුණගැහෙන්න කෙනෙක් ඇවිත් ඉන්නවා”

අළු යට ලූ ගිනි පුපුරු මෙන් වරින්වර මතුවන දේපළ පිළිබඳ මතගැටුම මා තුළ ඇති කළ කම්පනය සහ පීඩනය මා වෙහෙසට පත්කළා පමණක් නොවේ. කලකිරීම,වේදනාව සහ පසුතැවීම යන සියළු වේදනාකාරී හැඟීම් තුලින් මා අසහනයට පත්වූ වාර ගනණ අපමණය.එහෙත් සියල්ල සමසිතින් විඳ දරාගෙන නුවර සිට කොළඹට දිනපතා දුම්රියෙන් පැමිණෙමින් මගේ වෘත්තීය ජීවිතය දෙදරවා නොගෙන ජීවිතයට මුහුණ දීමට මම තීරණය කොට ගතිමි.කෙසේ වුවත් මා තුල නිසඟයෙන් පිහිටා තිබූ මුදු මොළොක් ගතිගුණ ක්‍රමයෙන් වියැකී ගොස් මා විශාල වශයෙන් වෙනස්කම් වලට ලක් වෙමින් පවතින බව මම හඳුනා ගතිමි. ඒ වෙනස මටත් නොදැනී මා තුල ඇති වූවක් බව උදක්ම ඔබට කියා සිටිමි.මේ වනවිට මම මගේ ගර්භණී අවධියේ දොළොස් වන සතිය ඉක්මවමින් සිටියෙමි. සැලකිය යුතු තරමේ ශාරීරික අපහසුතාවක් නොවූයෙන් මගේ එදිනෙදා කටයුතු සුපුරුදු පරිදි කරගැනීම මට එතරම් අභියෝගයක් නොවුණි.

00000000000

එක්තරා දිනයක කොළඹ සිට නුවර බලා දුම්රියෙන් එන විට පොල්ගහවෙල පසුවූ තැන් සිට එක්තරා නුපුරුදු වේදනාවක් යටිබඩ පෙ-දෙසින් නැගෙන්නට වූයෙන් මම සසංක ඇමතුවෙමි.ඔහුගේ දුරකථනය ආවරණ කලාපයෙන් බැහැර වී ඇති බවට පණිවිඩයක් නිකුත් වූ අතර දුෂ්කර වුවත් වේදනාව දරාගෙන මම නියමිත දුම්රිය ස්ථානය දක්වාම පැමිණියෙමි. අම්මා මා දැනුවත් කළේ හැකි ඉකිමනින් කුලී රියක් ගෙන්වාගෙන නිවසට ගොස් සසංක සමඟ ගොස් රෝහල් ගත වන ලෙසයි.නිවසට ලඟා වන විට වේදනාව තරමක් සමනය වී තිබුණද ක්ලාන්ත ගතියක් දැනෙන්නට වූයෙන් මම බෙහෙවින් බියට පත් වී සිටියෙමි. නානකාමරයට වැදී මනාව පිරිසිදු වූ පසු කිසියම් සැහැල්ලුවක් දැනුණෙන් මම රෝහල් ගත වීමට අවශ්‍ය සුළු කලමනා කිහිපයක් කුඩා ගමන් මල්ලකට අසුරා සසංකගේ මව සොයා ගොස් මගේ තත්ත්වය පැහැදිලි කළෙමි.ඇය ගම්මිරිස් ඇට පිරුණු කුල්ල උකුලේ තබාගෙන බොල් ගම්මිරිස් ඇට තෝරා මිදුලට විසිකරමින් ඉතා සැහැල්ලුවෙන් මා කී සියල්ල අසා සිටියා විනා හිස ඔසවා මා දෙස බැල්මකුදු නොහෙලුවාය. අසල නිවසක කිකිළියක් පිටුපස මිදුලේ ගොඩ ගසා තිබූ පොල් ලෙලි තට්ටුව මත වසා කිරා වැටෙමින් සිටියාය. නිසොල්මන් සැඳෑ පරිසරය අජීවී හැඟීම් විනා වේදනා බර සිතට සහනයක් රැගෙන නාවේය.

“අම්මෙ, මට මෙහෙම එක තැනකට වෙලා නිකම්ම බලා ගෙන ඉන්න බැහැ. සසංකට කථා කරන්න විදියකුත් නැහැ. අම්මට බැරි නං තලතා ව හරි එවනවද මා එක්ක ඉස් පිරිතාලෙට යන්න”

එවර ඈ හිස ඔසවා සෘජුව මා දෙස බැලුවාය.

“ඔව් ඉතින් තමුන්ට එක විදියකට ඉන්න බැරි බව නං මට දැනිලා බොහොම කල්”

උපහාස මුඛයෙන් කී ඕ වේගයෙන් ඇතුළු ගෙට ඇවිද ගියා විනා මා පිළිබඳ තැකීමක් නොකලාය. කුලී රියක් ගෙන්වා ගත් මම තලතා සමඟ ගොස් කුඩා පුද්ගලික රෝහලක ට ඇතුලත් වුණෙමි. මගේ ජීවිතයේ අඳුරුම දිනය උදා වූයේ එලෙසිනි. මා මහත් සේ බලාපොරොත්තු තබා සිටි මගේ දරුවා මා හැර ගියේය. සසංක මහත් දයාවෙන් මගේ හිස පිරිමදිමින් ඇඳ කොනක වාඩි වී සිටියේය. ඒ මුහුණේ කිසිත් සටහන් වී නොතිබුණි. එසේ නැතහොත් සටහන් වී තිබූ දෙය මට කියවා ගත නොහැක් වූවාවත්ද? මට අදටත් දුම්රියෙන් මෙල්බර්න් නගරය කරා ගමන් ගන්නා සරත් සෘතු වේ ඇතැම් දින වලදී මග දෙපස පිපී ඇති නෙක පැහැ මල් දකින විට එදින නුවර නගරයේ මා නේවාසිකව හුන් කුඩා රෝහලේ ගෙළයනේ පිපී තිබූ සුදෝ සුදු පිච්ච මල් සිහිවී කාන්සිය මුසු වේදනාවකින් හදවත බර වේ. ඒ පිච්ච මල් සමඟ ඈඳී ඇත්තේ සසංක පිළිබඳ මතකය නොවේ දැයි මා සමඟ යාබද අසුනේ නිතරම ගමන් ගන්නා මගේ අයර්ලන්ත ජාතික මිතුරිය කැත්‍රියෝනා එවිට අසන්නීය. මගේ ඇස කොනකට නැගී තුනී කඩදාසි ලේන්සුවක සැඟව යන බිඳුණු කුඩුම්භයේ වේදනාව මා පීඩාවට පත් නරන හැම විටකම කැතී මගේ සුරත ගෙන වැරෙන් සොලවා මගේ සිත සවිමත් කරන්නීය. මා කනස්සල්ලෙන් සිටිනු දැකීමට ඈ නොකැමැතිය.

වේදනාවෙන් තොරව ජීවිතය ගෙවාගත හැකි නම් ඊට වඩා යහපත් දෙයක් තවත් නැති බව නැවත වාරයක් පසක් කරමින් සසංක සහ මම යළිත් රේල් පීලි දෙකක් බවට පත් වී සිටියෙමු. අපේ දරුවා අප අතර ආයාසයෙන් ගොඩනගන්නට දැරූ බන්ධනය අපට දැන් අහිමි වී අවසන්ය.ගඟක් තරමට හැඬූ නමුත් මගේ හදවතේ කොනක කිසිදා අමතක නොකළ හැකි තැනක ඒ සොඳුරු ජීවියා කුස දරාගෙන මා මැවූ කප්පරක් සිහින නිධන් වී තිබේ.

අම්මාත් , තාත්තාත් , අක්කා සහ නාත් අයියාත් සිඟිත් මනහාරිත් ඇරුණු කොට කිසිවෙකු සමඟ පමණට වඩා සමීප නොවී නිසංසලේ දිවි ගෙවූ මට මා පසු කරමින් සිටි දුෂ්කර ජීවිතයේ තවත් එක් වේදනාබර කඩුල්ලක් තරණය කරන්නට වූයේ පෑරුණු හිතේ වේදනාව තුනී වන්නට තරම්වත් කාලයක් නොදෙන තරමට කුරිරු වෙමිනි. මා පෙර භවයක සිදු කළ අකුසල කර්ම පෝලිමේ ඇවිත් පිළිවෙලකට මට දඬුවම් දෙන්නට පටන් ගෙන තිබුණි. මා එකී යථාර්තයට මුහුණ දෙමින් දුක්බර ජීවිතයක් ගෙවමින් කඳුලු බොමින් සිටි යුගය නිමා වී ඇතත් ඒ නටඹුන් තවමත් මා තුල දනවන තැවුල අපමණය.

ඒ වනවිට මම නැවතත් මගේ පෞද්ගලික දේශණ පැවැත්වීම ආරම්භ කර තිබූ අතර පසුගිය සමයේ මා වෙනුවෙන් මගේ දේශණ කරගෙන යෑමට තරම් කාරුණික වූ මගේ මිතුරිය යුරෝපා රටක රැකියාව ලබා පිටත්ව ගියාය. සතියේ දිනවල නුවර සිට කොළඹ බලා රැකියා ස්ථානයට පැමිණීමත් සතිඅන්තයේ පෞද්ගලික භාෂා මධ්‍යස්ථාන වල දේශණ පැවැත්වීම සඳහා සහභාගී වීමත් හේතුවෙන් කාර්යය බහුල වී සිටි මම මා අමතක කරමින් සිටියෙමි.එවන් පසුබිමක මා සසංක අමතක කොට තිබූ බැව් අමුතුවෙන් කිව මනා නැති මුත් ඔහු මගේ ජීවිතයේ එක් පලුවක් වසා සිටි සෙවණැල්ලක් ව ඔහු සිටිය බව මේ අවංක සටහන තුල මා ලියා තැබිය යුතුය.ඇල්මැරුණු පවුල් ජීවිතය තුල වරින්වර දේපළ අරභයා හටගත් කටුක බහිනබස් වීම් ඇරුණු කොට අප අතර හටගත් වෛරයක් හෝ තරහවක් නොවීය. හැකි හැම විටම එකිනෙකා පිළිබඳව විපරම් කර බැලීමේ නාමික පුරුද්දෙන්ද අපි අවමවශයෙන් අත්මිදී නොසිටියෙමු.

එක් සිකුරාදාවක දිවා විවේකයට විනාඩි කීපයක් ඉතිරිව තිබියදී මගේ මේසය මත වූ දුරකථනය නාදවන්නට වූයේය.අනෙක් පස සිටියේ අප ආයතනයේ පිළිගැනීමේ නිළධාරිණියයි.

“මැඩම් මුණගැහෙන්න කෙනෙක් ඇවිත් ඉන්නවා”

“අපේ තාත්ත නේද දිදුලා ?”

“නැහැ මැඩම්.මිස්ටර් විදානපතිරණ නෙමේ.ලේඩි කෙනෙක් ඇවිත් ඉන්නෙ. නම චත්‍රා කැල්ලපත.”

“මං එහෙම කෙනෙක්ව දන්නෙ නං දිදුලා. කමක් නැහැ එයාට ඉඳගන්න කියන්න. මං ඉක්මනට එන්නං”

චත්‍රා කැල්ලපත යනු කවුරුන්දැයි ඒ වනවිට මා දැන සිටියේ නැත.නමුත් මගේ ජීවිතයේ මා නොදත් අනාගතයක් තීරණය කළ ගැහැණිය මා සොයා ඇවිත් සිටියාය. කුඩා පුතණුවකු සමඟ අමුත්තන් රැඳී සිටින ශාලාවේ සුවපහසු සෝපාවේ අසුන්ගෙන සිටි ඕ මා සමඟ සිනාසුණාය. ඉතා පිළිවෙලට උඩරට ඔසරියෙන් සැරසී ගෙලමුලට වන්නට කොණ්ඩය බැඳ සිටි ඈ සුන්දර කාන්තාවක වූවාය.

“කොහොමද දුලිනි”

ඈ මා ඇමතුවේ කලක සිට හඳුනන මගේ මිතුරියක මා අමතන පරිද්දෙනි. මම ඇයට පසෙකින් තිබූ ආසනයේ ඉඳගෙන ඔසරිපට උකුල මත තබා ගතිමි.

**මතු සම්බන්ධයි**





අතුල උපසිරි කල්දෙමුල්ල ගේ සිතුවමින්